Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි / All rights Reserved

# මතුගම අධ්‍යාපන කලාපය


## දෙවන වාර ඇගයීම - 2023

| 07 ශ්‍රේණිය | ගණිතය | I, II පත්‍රය | පැය දෙකයි |
|---|---|---|---|

**නම : ......................................................................................................................................**

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. රූපයේ දී ඇති කෝණයේ බාහු නම් කරන්න.





02. 7125 සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය සොයන්න.

03. විසඳන්න. $5x - 1 = 19$

04. 128 සංඛ්‍යාව පාදය 2 වූ දර්ශක ආකාරයෙන් ලියන්න.


05. දී ඇති ත්‍රිකෝණය හැඳින්විය හැකි නම් දෙකක් ලියන්න.



06. හිස්තැන් පුරවන්න.

සමාන්තර සරල රේඛා දෙකක් අතර පරතරය ...................................... වේ. මෙම පරතරය සරල රේඛා දෙක අතර ...................................... නම් වේ.

07. සනක රාමුවේ දැක්වෙන සංඛ්‍යාව දශමයක් ලෙස හා භාගයක් ලෙස දක්වන්න.




දශමය .......................... භාගය ..........................


08. අගය සොයන්න. $(+3.5) + (-1.4) + (-3.5)$

09. පහත ප්‍රකාශනය වචනයෙන් විස්තර කරන්න. $20 + \frac{P}{3}$


10. පහත සඳහන් සංඛ්‍යා පිළිවෙලින් 9 න් හා 6 න් බෙදේ. එම සංඛ්‍යා ලබා ගැනීමට හිස්කොටු පුරවන්න.

34 ☐ 41 ☐

11. රූපයේ පරිමිතිය වීජීය ප්‍රකාශනයකින් ලියා සුළු කරන්න.





12. සවිධි බහුඅස්‍ර තෝරන්න.




13. බිස්කට් පැකට්ටුවක බර 400g කි. එවැනි පැකට් 12 ක බර කිලෝග්‍රෑම් වලින් දක්වන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

14. දී ඇති වෘත්තයේ කේන්ද්‍රය හා විෂ්කම්භය නම් කරන්න.




15. සුළු කරන්න.


i. $3.751 \times 100$
ii. $32.41 \div 1000$

16. $30, 50, 70$ යන සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.


17. 18 වන සියවසේ ආරම්භක දිනය හා අවසාන දිනය ලියා දක්වන්න.

18. $y = mx + c$ සූත්‍රයේ $m = 3, x = 2$ හා $c = 5$ නම් $y$ හි අගය සොයන්න.

19. ඝනකාභ හැඩැති පෙට්ටිය මුළුමනින්ම පිරවීම සඳහා පැත්තක දිග 2 cm වූ ඝනක කීයක් ඇසිරිය හැකිද ?




20. මෙම රූපයේ සමමිතික අක්ෂ කීයක් තිබේද?




## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් සෑම ප්‍රශ්නයකටම ලකුණු 11 බැගින් ද හිමිවේ.**

01. ඝන වස්තුවක් අවකාශයේ ගන්නා ඉඩ ප්‍රමාණය එම ඝන වස්තුවේ පරිමාවයි.


a) i. පරිමාව මැනීමට යොදා ගන්නා සම්මත ඒකක 2 ක් නම් කරන්න

ii. රූපයෙහි දැක්වෙන බඳුනෙහි ජලය 12 $cm^3$ ක් අඩංගු වේ. බඳුනෙහි පරිමාව නිමානය කරන්න.




iii. පැත්තක දිග 3 cm ක් වන ඝනකයක පරිමාව සොයන්න.

iv. රූපයේ දැක්වෙන මෙම ඝනකාභ හැඩැති පෙට්ටියේ මිනුම් අනුව එහි පරිමාව සොයන්න.




v. මෙම පෙට්ටිය මුළුමනින්ම පිරවීමට පැත්තක දිග 3 cm ඝනක කීයක් අවශ්‍ය වේද ?

b) පස් දෙනෙකු සිටින සහන්ගේ නිවසට දිනපතා රැගෙන එන කිරි බෝතලය මෙහි දැක්වේ.




i. 1375 $ml$ , ලීටර් හා මිලි ලීටර් වලින් දක්වන්න.

ii. සහන්ගේ මව එම කිරි ප්‍රමාණයට ජලය 150 ml ක් එක්කර මිශ්‍රණයක් සකසයි. එම මිශ්‍රණයේ ප්‍රමාණය කොපමණද?

iii. එම මිශ්‍රණය රත් කිරීමේදී 10 $ml$ ක් අපතේ යයි නම් ඉතිරිවන කිරි ප්‍රමාණය සොයන්න.

iv. පවුලේ සැමට සමාන කිරි ප්‍රමාණයක් ලබා දෙයි නම් එක් අයෙකුට ලැබෙන කිරි ප්‍රමාණය සොයන්න.

v. කිරි බෝතලයක් රු. 180/- නම් දින 6 කට වැයවන මුදල සොයන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02. i. 5 cm ක් දිග AB නම් සරල රේඛා ඛණ්ඩය අඳින්න.

ii. AB බාහුවක් වන පරිදි B හි $120^0$ ක කෝණයක් නිර්මාණය කරන්න.

iii. එම බාහුව මත BC = 6 cm වන පරිදි C ලක්ෂ්‍යය ලකුණු කරන්න.

iv. විහිත චතුරස්‍රය හා කෝදුව භාවිතයෙන් ABCD සමාන්තරාස්‍රය අඳින්න.

v. $D\hat{A}B$ අගය මැන ලියන්න.

03. a) P = {"MATHUGAMA" යන වචනයේ අකුරු}

i. P කුලකය වෙන් රූපයක් මගින් දක්වන්න.

ii. අවයව ඇසුරෙන් දක්වන්න.

b) පහත කුලකය නිශ්චිතව හඳුනාගත හැකි පොදු ලක්ෂණ මගින් ලියා දක්වන්න.

B= { 2, 3, 5, 7 }

c) මතුගම සිට A,B, C නගර 03 ක් සඳහා පිළිවෙලින් මිනිත්තු 12, 15 හා 30 කට වරක් බස් රථ ධාවනය වේ. පෙ.ව. 8.00 ට බස් රථ තුනම එකවර පිටත් වුයේ නම් නැවත බස්රථ 3 ම එකවර පිටත්වන වේලාව සොයන්න.

04. i. 3.021 ගණක රාමුවකින් දක්වන්න.

ii. $\frac{13}{20}$ භාග සංඛ්‍යාව දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

iii. සුළු කරන්න. a) 1.045 x 9 b)

| g | mg |
|---|---|
| 12 | 532 |
| | 4 × |

iv. සමාන යකඩ කැබලි 7 ක බර 3.752 kg වේ. එක් කැබැල්ලක බර ග්‍රෑම් වලින් සොයන්න.

05. i. 2023.09.01 දිනය අයත්වන දශකය, සියවස, සහස්‍රය ලියා දක්වන්න.

ii. කොටුව තුළ ඇති වර්ෂ අතුරින් අධික වර්ෂ තෝරා ලියන්න.

| | | |
|---|---|---|
| 2007 | 1956 | 1074 |
| 1600 | 1506 | |

iii. දිලීපගේ උපන් දිනය 2012.11.04 වේ. 2023.09.01 දිනට ඔහුගේ වයස සොයන්න.

iv. දිලීපගේ නැගණිය ඉපදෙන විට දිලීපගේ වයස අවු: 5 මාස 2 දින 03 කි. නැගණියගේ උපන් දිනය සොයන්න.

06. i. සුළු කරන්න. a) $\frac{2}{3}+\frac{1}{3}$ b) $3\frac{6}{7}-1\frac{3}{5}$


ii. (-5) + (+4) හි අගය සංඛ්‍යා රේඛාවක් ඇසුරෙන් සොයන්න.

iii. $4x^2y$ විහිදුවා ලියන්න.

iv. $x = 3$ හා $y = 6$ නම් $4x^2y$ හි අගය සොයන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

07. a) සෘජුකෝණාස්‍රාකාර ආරාධනා පත්‍රයක පැත්තක දිග 3 cm වූ සමචතුරස්‍රාකාර කොටසක් සැරසිල්ලක් සඳහා වෙන් කර ඇත.





i. සම්පූර්ණ ආරාධනා පත්‍රයේ වර්ගඵලය සොයන්න.

ii. සැරසිල්ල සඳහා වෙන්කර ඇති කොටසේ වර්ගඵලය සොයන්න.

iii. ආරාධනා පත්‍රය වටා රිබන් පටියක් අලවා ඇත. අලවා ඇති රිබන් පටියේ දිග සොයන්න.

b) දී ඇති ආස්තර දෙකේ පරිමිතිය සමාන නම් $a$ හි අගය සොයන්න.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 7 ශ්‍රේණිය - ගණිතය - පිළිතුරු පත්‍රය

## 2023 - II වන වාරය

## I කොටස

1. AB හා BC
2. 6
3. $x = 4$
4. $2^7$
5. මහා කෝණී / සමද්විපාද
6. සමාන / ලම්බ දුර
7. 0.2 / $\frac{2}{10} = \frac{1}{5}$
8. $-1.4$
9. P, 3 න් බෙදා 20 ක් (ට) එකතු කරන්න.
10. 2 / 4
11. $P+1+P+2x+3 = 2P+2x+4$
12. B හා D
13. 4800 g / 4.8 kg
14. කේන්ද්‍රය - O විෂ්කම්භය - AB
15. 375.1 / 0.03241
16. 10
17. 1701.01.01 / 1800.12.31
18. $y = 11$
19. 40
20. 2 (1 සිට 20 දක්වා ප්‍රශ්නවලට ලකුණු 02 බැගින් හිමි වේ.)

## II කොටස

1. a) i) $cm^3$, $m^3$ — ①
   ii) 18 $cm^3$ — ②
   iii) 27 $cm^3$ — ②
   iv) 324 $cm^3$ — ②
   v) $\frac{324}{27} = 12$ — ②

   b) i) 1 l 375 ml — ①
   ii) 1375 + 150 = 1525 ml — ①
   iii) 1525 − 10 = 1515 ml — ①
   iv) 1515 ÷ 5 = 305 ml — ②
   v) 180 × 6 = 1080 — ②

2. i) AB = 5 cm — ②
   ii) 120° නිර්මාණයට — ②
   iii) BC = 6 cm ලෙස C — ②
   iv) සමාන්තරාස්‍රයට — ③
   v) $D\hat{A}B = 60^\circ$ — ②

3. a) i) P — (M A T H U G) — ②
   ii) P = {M, A, T, H, U, G} — ②

   b) B = {10 ට අඩු ප්‍රථම සංඛ්‍යා} — ③

   c) පෙ.ව. 9.00 — ④ {පියවර සඳහා ලකුණු ලබාදෙන්න}

4. i) අංශකය සහිත සමාන කොටුවට — ③
   ii) $\frac{65}{100} = 0.65$ — ②
   iii) a) 9.405 — ② b) 50 g 128 mg — ②
   iv) 536 g — ②

5. i) දශකය - 203 ① සියවස - 21 ① සහස්‍රය - 3 ①
   ii) 1600 / 1956 — ②
   iii) අවු. 10 මා. 09 දි. 27 — ③
   iv) උපන් දිනය - 2018.01.07 — ③
   {පියවර සඳහා ලකුණු ලබාදෙන්න}

6. i) ⓐ $\frac{3}{3} = 1$ — ② ⓑ $2\frac{9}{35}$ — ②
   ii) සංඛ්‍යා රේඛාව / (−1) — ③
   iii) $4 \times x \times x \times y$ — ②
   iv) 216 — ②

7. i) 96 $cm^2$ — ②
   ii) 3 × 3 = 9 $cm^2$ — ②
   iii) 40 cm — ②
   iv) 12 cm. — ⑤
   {පියවර සඳහා ලකුණු ලබාදෙන්න}

CamScanner